සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

47 S

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : .................... සිංහල සාහිත්‍ය රසාස්වාදය** **කාලය : පැය 03 යි.**

**I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත් II කොටසෙහි 3 වන ප්‍රශ්නයටත් III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.**

### I කොටස

01. **(i) සිට (v) දක්වා කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

(i) "කෙල්ල, තෝ චණ්ඩාල එකක් ද, අවශේෂ හීන ජාතියෙහි එකක් ද?
   (අ) මෙහි කෙල්ල යනුවෙන් ආමන්ත්‍රණය ලබන්නී කවුරුන් ද?
   (ආ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුද?

(ii) මොකටද ඉතින්, ඔය පාරට්ටු බලන්න යන්නේ"
   (අ) ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.
   (ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කරන්නේ කවුද?

(iii) ලොවින් එකෙක් එක දෙයකට වෙයි සමත
   වෙනින් අනෙක් දෙයකට අනෙකෙක් සමත
   ........................................................ ......................
   ........................................................ ......................
   (අ) ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) මෙම කවියේ කියවෙන ආකාරයට සිදු නොවන කාරණය කුමක් ද?

(iv) (අ) අලුත ගෙනා මනාලිය පද්‍ය පන්තියෙහි රචකයා නම් කරන්න.
   (ආ) ඔහු විසින් රචිත නවකතාවක් හා වෙනත් පද්‍ය පන්තියක් ලියා දක්වන්න.

(v) 'මුඹ දන් ගිය මැනව මම රඳමි"
   (අ) ඉහත ප්‍රකාශය කළ තැනැත්තා මෙලෙස රැඳීමට හේතුව කුමක් ද?
   (ආ) මේ ප්‍රකාශය ඇතුළත් කතාව උපුටාගත් මුල් කෘතිය නම් කරන්න. (4 × 5 = 20)

02. පහත දී ඇති කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ වේ
රන්වන් කරල් බර වී දූන් බිමට නැ වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හුවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියලි දර

දරටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

NWP EXAM

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ සැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩා ගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙස ද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහි වී මගේ කම්මුල රතු පැහැය ගතී

(i) කවියා තම අත්දැකීම කීමට යොදාගෙන ඇති ආකෘතිය කොතෙක් දුරට ගැළපේද?
(ii) කවි පෙළ ඉදිරිපත් කිරීමේ දී යොදා ගෙන ඇති භාෂාව රස නිෂ්පත්තියට කොතෙක් ගැළපේද යන්න පැහැදිලි කරන්න.
(iii) සුන්දරහාමිගේ නිර්ව්‍යාජත්වය කවියා ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද?
(iv) කවි පෙළට වස්තු විෂය වී ඇත්තේ කුමක් ද?
(v) සුන්දරහාමි තුළින් ඉස්මතු වී පෙනෙන මිත්‍රශීලී බව හා ආගන්තුක සත්කාරයෙහි ලැදි බව කවියා ඉදිරිපත් කර ඇති ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5 X 5 = 25)

## II කොටස

03. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

රදාවානේ ඉස්කෝලයට නැති මහේශාක්‍ය ගතියක් කිරිඳිවැලේ ඉස්කෝලයට ඇත. එය පළාතේ තිබෙන ලොකුම ඉස්කෝලය ය. ගුරු මංඩලයේ ද තිහක් විතර සිටිති. කුඩා කඳු ගැටයක් මත පිහිටා තිබෙන මේ විශාල ගොඩනැගිල්ල දුටු විට ගෞරව සම්ප්‍රයුක්ත භයත් ඇතිවීම ඇති වෙයි. මම සබකෝලය වැනි හැඟීමකින් යුතුව තාත්තාත් සමඟ පඩිපෙළ නැග යමි. පාසලට ඇතුළුවන තැන වාහල්කඩක් වැනි තොරණක් ඇත. සීනුව එල්ලා තිබෙන්නේ එය මුදුණේය. රදාවානේ ඇත්තේ පුංචි සීනුවකි. ලොකු මහත්තයාගේ මේසය උඩ එය තබා තිබේ. විවේකයටත් ඉස්කෝලය ඇරීමටත් වේලාව පැමිණි විට ලොකු මහතා එය අතට ගෙන ඒ මේ අතට වනයි. කිරිඳිවැලේ තිබෙන්නේ පන්සලේ ගංටාරය වැනි විශාල සීනුවකි.

විද්‍යා දදාති විනයං පාසලේ බාල්ක වලද ආදර්ශ පාඨ ලියූ පුවරු සවිකර ඇත. උත්සාහ වන්තයා ජය ගනී. කම්මැලියාට දිවැස් තිබේ. ඇවිද්ද පය දහස් වටී. ප්‍රධාන සාලාව කෙළවරේ වේදිකාව මත විශාල මේසයක් ළඟ මුල් ගුරුතුමා වාඩි වී සිටී. ඔහු කණ්ණාඩියක් පැළඳ බිම බලාගෙන මොනවාදෝ ලියයි. වරින් වර කණ්ණාඩියට යටින් එබිකම් කර ඈත බලයි. ඔහුට පිටුපසින් බිත්තියේ විශාල ඡායාරූපයක් එල්ලා ඇත. ඒ මීට පෙර මෙහි සිටි මුල් ගුරුතුමාගේ ඡායාරූපයයි. ඔහු ඉතා ප්‍රසිද්ධ කෙනෙකි. පස්වන ප්‍රමාණයේ දී අපට නියම කර තිබුණු කියවීම් පොත ලියා ඇත්තේ ඔහුය. විශ්‍රාමලත් ප්‍රධානාචාර්ය දොන් දියෝනිස් වික්‍රමතිලක ගුරු මුහන්දිරම් තුමා -

මෙතන නුහුරු ගතියක් මට දැනෙයි. මා අඳුනන කිසිවෙක් මෙහි නැත. පංතියේ ළමයි ඉඳහිට මා දෙස හොරැහින් බලති. දවසින් දවස ඔව්හු එකා දෙන්නා මා සමඟ යාලු වෙති.

(i) රදාවානේ ඉස්කෝලයට වඩා කිරිඳිවැල ඉස්කෝලයේ කථකයා දකින වෙනස හා ඊට අදාළ හේතු දක්වන්න. (ලකුණු 05යි)
(ii) කිරිඳිවැල පාසලේ දක්නට ලැබුණු ළමයි ලියා තිබූ ආදර්ශ පාඨ මොනවා ද? (ලකුණු 05යි)
(iii) කිරිඳිවැලේ පාසලට යාම නිසා කථකයාට ලැබුණු වාසි දෙක කුමක් ද? (ලකුණු 05යි)
(iv) කතුවරයා ඉහත ඡේදයෙන් කදිම සජීවී අවස්ථා නිරූපණයක යෙදෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

නැතහොත්

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු හවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් මුදුනෙ වැදේ

NWPEXAM

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතකම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිම් ද මිනිසා සතු දෙනෙත තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැන ම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නොව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම කිසි කෙනෙකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයකදී එකට හමුවන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමුවේවා දකුණ

(i) කවි පෙළ සඳහා වස්තු විෂයය කර ගෙන ඇත්තේ කුමක් ද? (ල. 05)

(ii) පද්‍ය පන්තිය සඳහා කවියා උපයුක්ත කරගෙන ඇති භාෂාව පිළිබඳව ඇගයීමක් කරන්න. (ල. 05)

(iii) සමාජයේ යහපත්ව අදීන පුරවැසියකු ලෙස ජීවත්වීමේ දී හැඩගසා ගත යුතු ගුණාංග පැදි පෙළෙන් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව කෙටියෙන් කරුණු දක්වන්න. (ල. 05)

(iv) කවි පෙළ සාර්ථක නිර්මාණයක් බවට පත් කර ගැනීම සඳහා කවියා යොදාගෙන තිබෙන කාව්‍යෝපක්‍රම ඉවහල් වූ ආකාරය ඇගයීමට ලක් කරන්න. (ල. 10)

## III කොටස

**ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න. පිළිතුරකට වචන 150ක් වත් තිබිය යුතුය.**

04. තමා කලා කුසලතා දියුණු කර ගැනීමට සිරිසේනට ජයසිංහ ගුරු මහතාගෙන් ලැබුණු සහයෝගය තුංමං හංදිය නව කතාවේ එන පාසල අලංකාර කිරීම හා විවිධ ප්‍රසංගය පැවැත්වීම යන අවස්ථා දෙක ඇසුරෙන් විස්තර කරන්න. ලකුණු 15යි.

05. පරිසරයේ සිදුවන අත්දැකීමක් මුල් කර ගනිමින් උපන් මානව ගුණ ධර්ම නිරූපණය කිරීමට කවියා සමත් වී තිබේ. වැහිවළාකුළ කවි පෙළ ඇසුරින් විමසන්න. ලකුණු 15යි.

06. කතාවේ ප්‍රස්තුතයට මනාව ගැළපෙන ආකාරයෙන් උපමා භාවිතයට කතුවරයා දක්වා ඇති කුසලතාව නන්ද වස්තුව යොදා ගනිමින් පැහැදිලි කරන්න. ලකුණු 15යි

07. සමාජයේ පවතින විවිධාකාර මිනිස් දුර්වලතා හාස්‍යය හා උපහාසය මතුවන ආකාරයට සුභාෂිත කවියා ඉදිරිපත් කර ඇත. නියමිත කවි 03වත් යොදා ගෙන විමසන්න. ලකුණු 15යි.

NWP EXAM